# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2000 අංක 9 දරන
## වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 2000 මැයි මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

**2000 මැයි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : 35.00 යි.

# 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 2000 මැයි මස 04 වන දින.]

එල්. ඩී.—ඕ. 32/98.

**වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවක් පිහිටුවීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු, "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. — *ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

## I වන කොටස

### වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව පිහිටුවීම

2. (1) (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය. — *වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව පිහිටුවීම.*

(2) (1) වන උපවගන්තියෙන් සභාවට දී ඇති නාමයෙන් එය සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තවද, ඒ නාමයෙන් සභාව විසින් සහ ඊට විරුද්ධව නඩු පැවරිය හැකි ය.

3. (1) සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :— — *සභාවේ සංයුතිය.*

(අ) සභාවේ සභාපතිවරයා විය යුතු සමාජ සේවා විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ආ) සභාවේ උපසභාපතිවරයා විය යුතු සමාජ සේවා විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා ;

CM 030650 – 1000 (2019/08)

(ආ) සභාවේ ලේකම්වරයා විය යුතු සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ;

(ඇ) ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයා විමසා, ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන් නියෝජනය කිරීම සඳහා පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙක් ;

(ඉ) ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයා විමසා, වැඩිහිටි තැනැත්තන් වෙනුවෙන් සේවාවන් සලසන කටයුතුවල නිරත වී සිටින සහ මෙම පනත යටතේ ලියාපදිංචි වී ඇති ස්වේච්ඡා සංවිධාන නියෝජනය කිරීම සඳහා පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙක් ;

(ඊ) ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයා විමසා, වෘත්තිකයන්, සංස්ථාපිත මණ්ඩලවල සාමාජිකයන් සහ රජයේ නිලධරයන් යන අය අතුරින් නමින් හෝ ධුරයෙන් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් හතර දෙනෙක්.

(2) (අ) (1) වන උපවගන්තියේ (ඇ), (ඉ), හෝ (ඊ) ඡේද යටතේ පත් කරන ලද සාමාජිකයකු මෙහි මින් මතු "පත් කළ සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(ආ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කළ නිලබලයෙන් පත් වූ උපසභාපතිවරයාට අමතරව, ජනාධිපතිවරයා විසින්, (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ පත් කළ සාමාජිකයකු සභාවේ උපසභාපතිවරයකු ලෙස පත් කරනු ලැබිය යුතු ය.

පත් කළ සාමාජිකයන්ගේ ධුර කාලය.

4. සෑම පත් කළ සාමාජිකයකුම, මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා ඔහු කලින් ධුරය අත්හරිනු ලැබුවහොත් මිස, පත්වීමේ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, ඔහු එම ධුරයෙන් ඉවත්කරනු ලැබුවහොත් මිස, නැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය.

පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත්කිරීම හා ඉල්ලා අස්වීම.

5. (1) ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයා විමසා, යම් පත් කළ සාමාජිකයකු ඒ සඳහා හේතු දක්වා ධුරයෙන් ඉවත්කරනු ලැබිය හැකි ය.



(2) යම් පත් කළ සාමාජිකයකුගේ මියයෑම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත්කිරීම මගින් යම් ධුරයක පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයා විමසා සහ 3 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඒ සාමාජිකයා වෙනුවට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. එසේ පත් කළ සාමාජිකයෙක් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(3) ඕනෑම පත් කළ සාමාජිකයකුට ඕනෑම අවස්ථාවක තත් කාර්යය සඳහා ජනාධිපතිවරයා අමතන ලද ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) (අ) අසනීපවීම නිසා හෝ ආබාධිතවීම නිසා හෝ මාස හයකට නොඅඩු කාලයක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා යම් පත් කළ සාමාජිකයකුට සිය ධුරයේ කාර්ය තාවකාලිකව ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, එම අපහසුතාව පිළිබඳව ජනාධිපතිවරයාට ලිඛිතව දැන්වීම එම සාමාජිකයාගේ කාර්යය වන්නේ ය. ඉන් පසු ජනාධිපතිවරයා විසින්, අමාත්‍යවරයා විමසා සහ 3 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන, ඔහු වෙනුවට ක්‍රියාකිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(ආ) පූර්ව දැනුම් දීමක් නොමැතිව පිට පිටම සභාවේ රැස්වීම් තුනකට සහභාගිවීම පැහැර හැර ඇති යම් පත් කළ සාමාජිකයකු, නැවත පත් කරනු ලැබුවහොත් මිස, සභාවේ සාමාජිකත්වය අත්හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

6. අමාත්‍යවරයා විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලැබිය හැකි යම් දීමනාවක් සභාවේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

සභාපතිවරයා සහ සභාවේ රැස්වීම් පැවැත්වීම.

7. (1) සභාපතිවරයා පැමිණ සිටින සභාවේ සෑම රැස්වීමක දී ම ඔහු මුලසුන දැරිය යුතු ය. කිසියම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි විටෙක, උපසභාපතිවරුන්ගෙන් කෙනෙක් එවැනි රැස්වීමක මුලසුන දැරිය යුතු අතර, සභාපතිවරයා සහ උපසභාපතිවරුන් දෙදෙනා ද නොපැමිණි විටෙක එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරින් වෙනත් සාමාජිකයකු එම රැස්වීමේ මුලසුන දැරීමේ කාර්යය සඳහා තෝරාගත යුතු ය.

(2) සභාවේ සෑම රැස්වීමකම ගණපූරණය සාමාජිකයන් අට දෙනකු විය යුතු ය.

(3) සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි වේලාවක දී සහ ස්ථානයක දී අවශ්‍ය වාර ගණනක් සභාව රැස්විය හැකි අතර අවම වශයෙන් මසකට එක් වරක් වත් රැස්විය යුතු ය ; තවද මේ පනතේ විධිවිධානවලට හා එය යටතේ සාදන ලද යම් නියෝගයකට යටත්ව, සභාව විසින් එම රැස්වීම්වල කටයුතු සිදුකිරීමට අදාළ කාර්ය පටිපාටිය සකස් කර ගත හැකි ය.

පුරප්පාඩුවක් තිබීමේ හේතුව මත ක්‍රියා අවලංගු නොවිය යුතු බව.

8. සභාවේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ දී සිදු වූ දෝෂයක් නිසා සභාවේ යම් ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

සාමාජිකයන්ට බලතල පැවරීම.

9. සභාව විසින්, මෙම පනත මගින් සභාව වෙත පවරන ලද හෝ නියම කරන ලද හෝ භාර කරන ලද යම් බලතලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් සභාවේ ඕනෑම සාමාජිකයකුට හෝ සමාජ සේවා පළාත් අධ්‍යක්ෂවරයකුට පැවරිය හැකි අතර සභාව විසින් එවැනි බලතලයක් ක්‍රියාත්මක කිරීමේ දී හෝ කර්තව්‍යයක් හෝ කාර්යයක්, ඉටු කිරීමේ දී එවැනි සාමාජිකයකු හෝ අධ්‍යක්ෂකවරයකු සභාවේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් විය යුතු ය.

ජාතික මහ ලේකම් කාර්යාලයක් පිහිටුවීම.

10. සභාවේ කර්තව්‍ය ඉටුකිරීමේ දී ඊට සහයවීම සඳහා ජාතික මහ ලේකම් කාර්යාලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

සභාවේ මුද්‍රාව.

11. (1) සභාවේ මුද්‍රාව, සභාව විසින් තීරණය කොට සකස් කරගනු ලැබිය යුතු අතර සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) සභාවේ මුද්‍රාව සභාව විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි යම් තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය.

(3) සභාවේ මුද්‍රාව, සභාවේ අනුමැතිය ඇතිව සහ සභාවේ සභාපතිවරයා සහ සභාවේ එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර, කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර සභාපතිවරයා සහ එම සාමාජිකයා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් එම සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය.



(4) සභාවේ මුද්‍රාව තැබූ සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් සභාව විසින් පවත්වා ගෙන යා යුතු ය.

සභාවේ ප්‍රධාන කර්තව්‍යය.

12. සභාවේ ප්‍රධාන කර්තව්‍යය විය යුත්තේ ශ්‍රී ලංකාවේ සිටින වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සහ වැඩිහිටි තැනැත්තන්ට ආත්ම ගෞරවයක්, ස්වාධීනත්වයක් හා ගරුත්වයක් ඇතිව ජීවත්වීමට අවස්ථාව සලසා දීම ය.

සභාවේ අනෙකුත් කර්තව්‍යයන්.

13. 12 වන වගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව, සභාවේ අනෙක් කර්තව්‍යයන් පහත සඳහන් පරිදි විය යුතු ය:—

(අ) වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම පිළිබඳව රජයට උපදෙස් දීම ;

(ආ) ශ්‍රී ලංකාවේ පාරම්පරික සාරධර්ම මත පදනම් වූ පවුල් ඒකකය ශක්තිමත් කිරීම සඳහා රජයට හා අනෙකුත් සුදුසු ආයතනවලට වැඩසටහන් නිර්දේශ කිරීම ;

(ඇ) වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ, පළාත් බල මණ්ඩල, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ආගමික ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශයේ සංවිධානවලින් විමසා අවශ්‍ය විය හැකි සියලු පියවර ගැනීම ;

(ඈ) වැඩිහිටි තැනැත්තන් කෙරෙහි ළමා හා තරුණ පරපුරෙන් ඉටුවිය යුතු යුතුකම් ඔවුනට මනාව අවබෝධ කර දීමේ අදහසින් පාසැල්වල හා වෙනත් සුදුසු ස්ථානවල දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු හා වෙනත් වැඩසටහන් සංවිධානය කිරීම ;

(ඉ) වැඩිහිටි තැනැත්තන් සම්බන්ධයෙන් වූ අදාළ ජාත්‍යන්තර ප්‍රකාශන සහ සම්මුති ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පිළිගනු ලබන බවට හා ඒ අනුව ක්‍රියා කරන බවට වග බලා ගැනීම ;

(ඊ) වැඩිහිටි තැනැත්තන් පිළිබඳ නිවැරදි හා යථාවත් කරන ලද සංඛ්‍යාලේඛන පවත්වා ගෙන යාම ;

(උ) වැඩිහිටි තැනැත්තන්ගේ ගැටළුවලට බලපාන ප්‍රධාන හේතු සහ ඔවුන්ගේ අවශ්‍යතාවයන් හා අභිලාෂයන් හඳුනාගැනීමේ අදහසින් අධ්‍යයනයන් හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා ඒ හේතු මර්දනය කිරීම හෝ මුලිනුපුටා දැමීම සඳහා සහ ඔවුන්ගේ ඒ අවශ්‍යතා හා අභිලාෂ ඉටුකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම ;

(ඌ) වැඩිහිටි තැනැත්තන්ගේ ගැටළු, අවශ්‍යතාවයන් හා අභිලාෂයන් පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ අරමුණින් (උ) ඡේදයේ සඳහන් කර ඇති අධ්‍යයනයන් හා පර්යේෂණවල සොයා ගැනීම්වලට සුදුසු සියලු ක්‍රියා මාර්ග මගින් තිසි ප්‍රචාරයන් ලබාදීම ;

(එ) අනාථ වැඩිහිටි තැනැත්තන් සඳහා නවාතැන් සහිතව සුභ සාධක මධ්‍යස්ථාන, ක්‍රීඩා මධ්‍යස්ථාන, දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ වෙනත් සුදුසු ආයතන පිහිටුවීම සඳහා දිරි ගැන්වීම සහ එවැනි මධ්‍යස්ථානවලට හා ආයතනවලට අවශ්‍ය පහසුකම් සලසා දීම ;

(ඒ) වැඩිහිටි තැනැත්තන්ගේ තත්වය නගාලීම සඳහා රජය විසින් සහ ස්වේච්ඡා සංවිධාන හා පුද්ගල මණ්ඩල විසින් ආරම්භ කරන ලද හා ක්‍රියාවේ යොදවනු ලබන වැඩසටහන් හා යෝජනා ක්‍රම සමීක්ෂණය කිරීම හා සම්බන්ධීකරණය කිරීම ;

(ඔ) වැඩිහිටි තැනැත්තන් වෙනුවෙන් සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම හා ක්‍රියාවේ යෙදවීම ;

(ඕ) වැඩිහිටි තැනැත්තන් සඳහා ඇති සේවා සම්බන්ධයෙන් තොරතුරු සැපයීම ;

(ක) වැඩිහිටි තැනැත්තන්ගේ දැනගැනීම සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා ඇති වැටුප් ගෙවන හා වැටුප් නොගෙවන රැකියා අවස්ථා පිළිබඳ නාමාවලියක් පවත්වා ගෙන යාම හා හැකි සෑම අවස්ථාවකම ඔවුන්ට ආදායමක් ලැබෙන සේවා නියුක්තියක නිරතවීම සඳහා උපකාර කිරීම ;

(ග) මහජනතාවගේ දැනගැනීම සඳහා වැඩිහිටි තැනැත්තන්ගේ සහජ හැකියාවන් සහ දක්ෂතා ඇතුළත් කොට ඔවුන් පිළිබඳ නාමාවලියක් පවත්වා ගෙන යාම ;



(ජ) අවශ්‍ය නීති උපදෙස් ලබාගැනීමට වැඩිහිටි තැනැත්තන්ට පහසුකම් සැලසීම සහ මෙම පනතේ 25 වන වගන්තිය යටතේ සහනයක් ලබා ගැනීමට අවශ්‍ය වැඩිහිටි තැනැත්තන්ට උපකාර කිරීම ;

(ට) තරුණ පරපුර විශ්වාසයෙන් හා ධෛර්යයෙන් යුක්තව ස්වකීය මහලු වියට මුහුණ දීම සඳහා සූදනම් කිරීමේ අරමුණින් විවිධ වැඩ සටහන් හඳුන්වා දීම සහ යෝග්‍ය සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ආරම්භ කොට තරුණ පරපුර එවැනි යෝජනා ක්‍රමවලට දායක වීම සඳහා උනන්දු කරවීම.

14. සභාව විසින්, පහත සඳහන් බලතල ඇතුළුව එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සියලුම බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය :— සභාවේ බලතල.

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, ගැනීම හෝ බද්දට හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම හෝ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ආ) සභාව වෙත ප්‍රදානය කරන ලද හෝ සභාව විසින් අත්කරගන්නා ලද ඕනෑම ඉඩමක් මත ගොඩනැගිලි ඉදිකිරීම ;

(ඇ) සභාවේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලුම ගිවිසුම්වලට කෙලින්ම හෝ ඒ වෙනුවෙන් බලයලත් යම් නිලධරයකු හෝ නියෝජිතයකු මගින් එළඹීම සහ ඉටු කිරීම ;

(ඈ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරිකිරීමේ හෝ තැන්පතු ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම ;

(ඉ) සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යම් මුදල් ප්‍රමාණ ණයට ගැනීම ;

(ඊ) ශ්‍රී ලංකාවෙහි සහ විදේශයන්හි ප්‍රභවයන්ගෙන් ලැබුණා වූ චංචල හා නිශ්චල යන දෙආකාරයෙන් ම වූ ප්‍රදාන, පරිත්‍යාග සහ රික්ථවරණ භාර ගැනීම හා පිළිගැනීම සහ ඒවා සභාවේ කර්තව්‍ය ඉටු කිරීමට යොදගැනීම ;

(ඌ) සභාවේ කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වූ රීති සකස් කිරීම ;

(ඍ) සභාවේ කර්තව්‍ය යථා පරිදි ඉටු කිරීම පහසු කිරීම සඳහා සාමාන්‍යයෙන් අවශ්‍ය වන සියලුම ක්‍රියා සහ දේ ඉටු කිරීම.

## II වන කොටස

## වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.

15. (1) දරුවන් විසින් ඔවුන්ගේ දෙමව්පියන් හිතාමතාම නොසලකා හැරීම නොකළ යුතු වන අතර ඔවුන්ගේ දෙමව්පියන්ට රැකවරණය සැලසීම සහ ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳව සොයා බැලීම දරුවන්ගේ කාර්යය සහ වගකීම විය යුතු ය.

(2) රජය විසින් දරුවන් නොමැති හෝ දරුවන් විසින් නොසලකා හරින ලද අනාථ වැඩිහිටි තැනැත්තන්ට යෝග්‍ය වාසස්ථාන පහසුකම් සලසා දිය යුතු ය.

(3) කිසියම් ගාස්තුවක් මත හෝ නොමැතිව වෙනත් යම් තැනැත්තකුට ප්‍රවිෂ්ට වීමට හෝ පරිහරණය කිරීමට හිමිකම ඇති යම් ගොඩනැගිල්ලක් හෝ යම් ස්ථානයක් හෝ ආයතනයක් තුළට යම් වැඩිහිටි තැනැත්තකු ප්‍රවිෂ්ටවීම හෝ පරිහරණය කිරීම සම්බන්ධයෙන් එකී වැඩිහිටි තැනැත්තා ඔහුගේ වයස හේතුවෙන්, කිසියම් විශේෂ වගකීමකට, තහනමකට හෝ කොන්දේසියකට, යටත් නොවිය යුතු ය.

## III වන කොටස

## ලියාපදිංචි වීම

සභාව වෙත ලියාපදිංචි වීම.

16. කෙලින්ම හෝ වෙනත් සංවිධානයක්, ආයතනයක් හෝ මණ්ඩලයක් මගින්, වැඩිහිටි තැනැත්තන්ට යම් විධියකින් හෝ ආකාරයකින් සේවා හෝ ආධාර සැලසීමෙහි යෙදී සිටින යම් තැනැත්තකු හෝ ස්වේච්ඡා හෝ අන්‍යාකාරයක යම් සංවිධානයක් මේ පනත යටතේ ලියාපදිංචි විය හැකි ය. මේ වගන්තියෙහි "සංවිධානය" යන්නට අමාත්‍යාංශයක් හෝ රජයේ දෙපාර්තමේන්තුවක් ඇතුළත් නොවේ.



ලියාපදිංචි වීම සඳහා ඉල්ලීම.

17. මෙම පනත යටතේ ලියාපදිංචි වීම සඳහා වන සෑම ඉල්ලීමක්ම, නියමිත ආකෘතියෙන් සහ නියමිත ආකාරයෙන් සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ලියාපදිංචි කිරීම.

18. (1) 17 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුණු විට, ඉල්ලීම කළ තැනැත්තා හෝ සංවිධානය විසින් සලසනු ලබන සේවා සහ ආධාර උපකාරයන් පිළිබඳව අවශ්‍ය පරීක්ෂණ සහ විමර්ශන පැවැත්වීමෙන් පසුව එම තැනැත්තා හෝ සංවිධානය මෙම පනත යටතේ ලියාපදිංචි කරනු ලැබිය හැකි අතර, ඒ වෙනුවෙන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තාට හෝ සංවිධානයට, මෙම පනතේ මින් මතු, අවස්ථාවෝචිත පරිදි, "අනුමත තැනැත්තා" හෝ "අනුමත සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) යම් තැනැත්තකු හෝ සංවිධානයක් මගින් සලසා ඇති සේවා සහ ආධාර උපකාරයන් අවශ්‍ය මට්ටමින් නොපවතින බවට සභාව සෑහීමකට පත්වන විටක දී, එකී තැනැත්තා හෝ සංවිධානය විසින් ලියාපදිංචි වීම සඳහා කරන ලද ඉල්ලීම සභාව විසින් තත් කාර්ය සඳහා කරනු ලබන නියමයක් මගින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි අතර එම නියමයේ ප්‍රතික්ෂේප කිරීමට හේතු දැක්විය යුතු ය.

(4) (3) වන උප වගන්තියේ සඳහන්ව ඇති නියමයේ සහතික පිටපතක්, එය ප්‍රතික්ෂේප කිරීමෙන් සතියක් ඇතුළත සභාව විසින් ඉල්ලුම්කරුට යැවිය යුතු ය.

(5) (3) වන උපවගන්තියේ සඳහන්ව ඇති නියමයන් මගින් අතෘප්තියට පත් ඉල්ලුම්කරුවකුට එම නියමයේ දින සිට දින තිහක් ඇතුළත එම නියමයට විරුද්ධව, අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

## IV වන කොටස

### මුදල්

සභාවේ අරමුදල.

**19.** (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය සඳහා වන අරමුදල නමින් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) පහත සඳහන් මුදල් අරමුදලට ගෙවිය යුතු ය :-

(අ) කලින් කල පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ;

(ආ) ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත කවර වූ හෝ ප්‍රභවයකින් පරිත්‍යාග හෝ රික්ථවරණ, ආධාර හෝ ප්‍රදාන වශයෙන් සභාවට ලැබෙන සියලු මුදල් ;

(ඇ) සභාවේ යම් චංචල හෝ නිශ්චල දේපළක් විකිණීමෙන් ලාභ වශයෙන් සභාවට ලැබෙන සියලු මුදල්.

(3) සභාවේ අරමුදලින් පහත සඳහන් මුදල් ගෙවිය යුතු ය :-

(අ) මෙම පනත යටතේ සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමෙහි දී සභාව විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය විය හැකි සියලු මුදල් ;

(ආ) වැඩිහිටි තැනැත්තන්ගේ තත්ත්වය නගා සිටුවීම සහ වැඩි දියුණු කිරීම සඳහා යම් තැනැත්තෙක් හෝ සංවිධානයක් විසින් කරන ලද විශිෂ්ට සහ උත්කෘෂ්ට සේවාවට උපහාරයක් වශයෙන්, එම තැනැත්තාට හෝ සංවිධානයට කරුණා සහගත ගෙවීමක් කිරීමට, සභාව විසින් බලය පවරනු ලද සියලු මුදල් ;

(ඇ) මෙම පනත මගින් හෝ එය යටතේ අරමුදලින් ගෙවනු ලැබීමට නියමිත සියලු මුදල්.

විගණනය සහ ගිණුම්.

**20.** (1) සභාවේ ආදායම සහ වියදම සම්බන්ධයෙන් ද, වත්කම් සහ බැරකම් සහ සභාවේ අනෙකුත් සියලු ගණුදෙනු පිළිබඳ නියි ගිණුම් පොත් තැබීමට සභාව විසින් සැලැස්විය යුතු ය.



(2) සභාවේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතු ය.

(3) සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු ය.

සභාවේ මුදල් ආයෝජනය කිරීම.

**21.** සභාවට අයත් යම් මුදල් ප්‍රමාණයක්, සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට ආයෝජනය කරනු ලැබිය හැකි ය.

## V වන කොටස

### සභාවේ කාර්ය මණ්ඩලය

සභාවේ කාර්ය මණ්ඩලය.

**22.** (1) සභාවේ කටයුතු යථා පරිදි සහ කාර්යක්ෂම ලෙස ඉටු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය යයි සභාව සලකන නිලධරයන් සහ සේවකයන් සභාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ අනිකුත් විධිවිධානවලට යටත්ව සභාව විසින්-

(අ) සභාවේ යම් නිලධරයකු හෝ සේවකයකු සම්බන්ධව විනය පාලනය පවත්වා ගෙන යාම හෝ ඔහු සේවයෙන් පහකිරීම ;

(ආ) සභාවේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ වේතන හා වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ;

(ඇ) සභාවේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සේවා නියම සහ කොන්දේසි තීරණය කිරීම ; සහ

(ඈ) සභාවේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ ප්‍රතිලාභය සඳහා අර්ථසාධක අරමුදලක් හා වෙනත් යම් සුභ සාධන යෝජනා ක්‍රමයක් පිහිටුවා එය විධිමත් කිරීම සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම,

කරනු ලැබිය හැකි ය.

සභාවේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය නිලධරයන් පත් කිරීම.

**23.** (1) සභාවේ ඉල්ලීම පිට රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු, ඒ නිලධරයාගේ ද ඒ නිලධරයා සේවයේ නියුක්තව සිටින අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, සභාවේ කාර්ය මණ්ඩලයට, ඒ හා සමාන කැමැත්ත

ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලබන කාල සීමාවකට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාල සීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින්, ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු සභාව විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක ඒ තැනැත්තා විසින් සභාවට සේවය කරනු ලබන කාල පරිච්ඡේදය ඒ ගිවිසුම යටතේ ඒ තැනැත්තාගේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා, ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සැලකිය යුතු ය.

## VI වන කොටස

### මණ්ඩලය පත් කිරීම

වැඩිහිටි තැනැත්තන් විසින් නඩත්තුව සඳහා කරනු ලබන ඉල්ලීම් තීරණය කිරීම සඳහා වන මණ්ඩලය.

**24.** (1) නඩත්තුව සඳහා වැඩිහිටි තැනැත්තන් විසින් කරනු ලබන ඉල්ලීම් පිළිබඳ තීරණය කරනු ලැබීම සඳහා මණ්ඩල එකක් හෝ වැඩි ගණනක් මේ පනතේ කාර්යය සඳහා පත් කරනු ලැබිය යුතු ය. (මේ වගන්තිය යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයක් මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.)



(2) මේ පනතේ උපලේඛනයේ විධිවිධාන මණ්ඩලයේ බලතල සම්බන්ධයෙන් ද, මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද, මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික සම්බන්ධයෙන් ද, මණ්ඩලයේ තීරණ සහ එකී තීරණවලට එරෙහිව වූ අභියාචන සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

නඩත්තු නියමයන් සඳහා වන ඉල්ලීම්.

**25.** (1) එක් දරුවකු හෝ දරුවන් වැඩි ගණනක් සිටින්නා වූ ද ස්වකීය නඩත්තුව සපයාගෙන යා නොහැකි වූ ද, (මේ වගන්තියේ "දෙමාපියන්" යනුවෙන් සඳහන් කරනු ලබන) වැඩිහිටි තැනැත්තකු විසින්, ස්වකීය නඩත්තුව සඳහා මාසික දීමනාවක් හෝ වෙනත් යම් වාරික දීමනාවක් හෝ එකවර ගෙවන මුදලක් තමා වෙත ගෙවන ලෙස, ඔහුගේ එක් දරුවකුට හෝ දරුවන් කිහිපදෙනකුට නියම කරන ලෙස මණ්ඩලය වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(2) ස්වකීය නඩත්තුව තමා විසින්ම පවත්වා ගෙන යා නොහැකි දෙමාපියකු පදිංචිව සිටින්නේ යම් අනුමත තැනැත්තකු හෝ ආයතනයක් භාරයේ ද, ඒ අනුමත තැනැත්තා හෝ ආයතනය විසින් ඒ මව හෝ පියාගේ නඩත්තුව සඳහා කරනු ලබන වියදම් පියවීමේ කාර්යය සඳහා, මාසික දීමනාවක් හෝ වෙනත් යම් වාරික ගෙවීමක් හෝ එකවර ගෙවන මුදලක් ඒ අනුමත තැනැත්තාට හෝ ආයතනයට ගෙවන ලෙස, ඒ මව හෝ පියාගේ දරුවකුට හෝ දරුවන්ට නියම කිරීම සඳහා වන ඉල්ලීමක්, මණ්ඩලය වෙත කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා, මවක් හෝ පියෙක් ස්වකීය නඩත්තුව තමා විසින්ම පවත්වා ගෙන යා නොහැකි ලෙස සලකනු ලබන්නේ ඔහුගේ සම්පූර්ණ හෝ අපේක්ෂිත ආදායම සහ අනෙකුත් ආර්ථික සම්පත්, ඔහුගේ මූලික පහසුකම් සැපයීමට සහ වාසස්ථාන, ආහාර හා ඇඳුම් පැළඳුම් ඇතුළු (එහෙත් එකී කරුණුවලට පමණක් සීමා නොවන) මූලික භෞතික අවශ්‍යතා ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී ය.

(4) මේ පනතින් අර්ථානුකූලව වැඩිහිටි තැනැත්තකු ද නොවන එහෙත් දරුවකු හෝ දරුවන් ඇති යම් තැනැත්තකු, ස්වකීය නඩත්තුව පවත්වා ගෙන යාමට නොහැකි හෝ නඩත්තුව පවත්වා ගෙන යාම කෙරෙහි බලපාන යම් මානසික හෝ ශාරීරික ආබාධයකින් පෙළෙන බවට මණ්ඩලය සෑහීමකට පත් වුවහොත්, එම තැනැත්තාට මේ පනතේ විධිවිධාන ආදාළ විය යුතු ය.

වග උත්තරකරුවන් එක් කිරීම.

**26.** නඩත්තු නියමයන් ලබාගැනීම අපේක්ෂා කරන්නේ යම් තැනැත්තකුට එරෙහිවද, (මෙහි මින් මතු "වගඋත්තරකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) එම තැනැත්තා විසින් ඉල්ලුම්කරු නඩත්තු කරවීමේ වගකීමට යටත් වන අනිකුත් තැනැත්තන්, ඉල්ලීමෙහි වගඋත්තරකරුවන් ලෙස එක් කරමින්, නියමිත ආකෘතියෙහි වූ දැන්වීම් එම තැනැත්තන් වෙත භාර දෙනු ලැබිය හැකි ය.

නඩත්තු නියමයන්.

**27.** (1) වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරු නඩත්තු කිරීම සාධාරණ සහ යුක්ති සහගත බවට සහ —

(අ) වගඋත්තරකරුට තමාගේ අවශ්‍යතා සහ තම කලත්‍රයාගේ සහ දරුවන්ගේ අවශ්‍යතා ඉටු කිරීමෙන් පසුව, ඉල්ලුම්කරුගේ නඩත්තුව සලසා දිය හැකි බවට ; සහ

(ආ) ඉල්ලුම්කරු උත්සාහ කළ නමුත්, ස්වකීය නඩත්තුව පවත්වා ගෙන යාම ඉල්ලුම්කරුට නොහැකි බවට,

මණ්ඩලය සෑහීමකට පත්වන්නේ නම්, 25 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් මත මණ්ඩලය විසින් ඉල්ලුම්කරුගේ වාසියට නඩත්තු නියමයන් කරනු ලැබිය හැකි ය.

(2) ඉල්ලුම්කරුගේ වාසියට නඩත්තු නියමයන් කරනු ලබන විට, මණ්ඩලය විසින් පහත සඳහන් සියලුම අවස්ථානුගත කරුණු (එහෙත් එම කරුණුවලට පමණක් සීමා නොවී) සැලකිල්ලට ගත යුතු ය :—

(අ) ඉල්ලුම්කරුට මූලික පහසුකම් ලබාදීම සහ ඔහුගේ මූලික භෞතික අවශ්‍යතා සපයා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි සාධාරණ වියදම් සැලකිල්ලට ගෙන ඉල්ලුම්කරුගේ මූල්‍යමය අවශ්‍යතා ;

(ආ) ඉල්ලුම්කරුගේ ආදායම් ඉපැයීමේ හැකියාව ඔහුට ඇති දේපළ සහ වෙනත් මූල්‍යමය සම්පත් සහ ඉල්ලුම්කරු තම ඉතිරිකිරීම් වැයකර ඇති ආකාරය හෝ ඔහුගේ මූල්‍යමය සම්පත් වියදම් කර ඇති ආකාරය ;

(ඇ) ඉල්ලුම්කරුගේ භෞතික හෝ මානසික අශක්නුතාවන් ;

(ඈ) වගඋත්තරකරුගේ ආදායම, මුදල් ඉපැයීමේ හැකියාව, දේපළ සහ වෙනත් මූල්‍යමය සම්පත් ;



(ඉ) වගඋත්තරකරුගේ කලත්‍රයා හෝ ළමයින් නඩත්තු කිරීමේ දී ඔහු විසින් දැරිය යුතු වියදම් ;

(ඊ) ඉල්ලුම්කරු නඩත්තු කිරීම සඳහා වගඋත්තරකරු විසින් ගෙවා ඇති මුදල් හෝ අන්‍යාකාරයක දායක වීම්.

(3) ඉල්ලීම ඉදිරිපත් කිරීමට පෙර කවර හෝ අවස්ථාවක දී ඉල්ලුම්කරු විසින් වගඋත්තරකරු අතහැර දමා හෝ නොසලකා හැර ඇති බවට මණ්ඩලය සෑහීමකට පත්වන්නේ නම් මණ්ඩලය විසින් නියම කරනු ලබන නඩත්තු මුදල් ප්‍රමාණය අඩුකරනු ලැබිය හැකි ය.

(4) ක්‍රියාපාත අතහැර දැමීම හෝ අතපසු කිරීම ඔප්පු කිරීමේ භාරය එසේ චෝදනා කරන වගඋත්තරකරු සතුවිය යුතු ය.

(5) මණ්ඩලය විසින් එක් වගඋත්තරකරුවකුට වැඩි සංඛ්‍යාවක් ඇති අවස්ථාවක දී, සාධාරණ හා යුක්තිසහගත යයි මණ්ඩලයට පෙනී යන ආකාරයට එම වගඋත්තරකරුවන් කීප දෙනා විසින් නඩත්තු මුදල් ගෙවිය යුතු ප්‍රමාණය බෙදා වෙන් කර දක්වනු ලැබිය හැකි ය.

(6) මේ පනත යටතේ ඉල්ලීමක් විභාග කිරීමට පෙර මණ්ඩලය විසින් පාර්ශ්වකරුවන් අතර සමථයක් ඇති කිරීම සඳහා, පාර්ශ්වකරුවන් අතර එකී විවාදයට භාජනය වූ කරුණු, සමථ නිලධරයකු වෙත යොමු කරනු ලැබිය යුතු ය.

නඩත්තු මුදල් සඳහා ඇප නියම කිරීමට මණ්ඩලයට ඇති බලය.

**28.** (1) නඩත්තු නියමයක් මගින්, එක්වර මුදලක් ගෙවීම හෝ මාසික දීමනාවක් හෝ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා වූ ගෙවීමක් කරන ලෙස විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින් නඩත්තු මුදල් ප්‍රදානය කිරීමේ දී–

(අ) මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි අවම මුදලක් බැංකුවක තැන්පත් කරන ලෙස ; හෝ

(ආ) එවැනි අවම මුදලකින් රක්ෂණ වාරිකයක් මිල දී ගන්නා ලෙස

ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි ය.

(3) නඩත්තු නියමයක් කිරීමේ දී මණ්ඩලය විසින් ගෙවීම කළ යුතු ආකාරය හෝ ක්‍රමය පිළිබඳව විධාන කරනු ලැබිය හැකි ය.

නඩත්තු නියම පදහා වූ කාලසීමාව.

29. (1) නඩත්තු නියමයක් යම් කෙටි කාලසීමාවක් සඳහා බවට, ප්‍රකාශිතව සඳහන් වන අවස්ථාවක දී හෝ ඒ නියමය පරිච්ඡින්න කරනු ලැබ ඇති අවස්ථාවක දී හෝ හැර —

(අ) නඩත්තු ප්‍රදානය කිරීම සුරක්ෂිත කර නොමැති නම්, ඉල්ලුම්කරු මියයාම හෝ වගඋත්තරකරු මියයාම යන මේ අවස්ථා දෙකින්, කලින් මියයාම සිදුවන අවස්ථාවක දී ; හෝ

(ආ) නඩත්තු ප්‍රදානය කිරීම සුරක්ෂිත කර තිබිණි නම්, ඉල්ලුම්කරු මියයාමේ දී,

ඒ නඩත්තු වූ නියමය අවසන් විය යුතු ය.

(2) වගඋත්තරකරුවන් එක් අයකුට වැඩි සංඛ්‍යාවකට එරෙහි නඩත්තු නියමයක් කරනු ලැබ ඇති අවස්ථාවක දී, යම් වගඋත්තරකරුවකු මියයාම ඉල්ලුම්කරුට නඩත්තු මුදල් ගෙවීම සඳහා අනෙක් වගඋත්තරකරුවන්ට ඇති වගකීම කෙරෙහි බල නොපෑ යුතු ය.

(3) යම් වගඋත්තරකරුවකු මියගිය විට ජීවත්ව සිටින වගඋත්තරකරුවන් අතර වගකීම බෙදන ලෙසට, ඉල්ලුම්කරුවකු විසින්, මණ්ඩලයෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

නඩත්තු සඳහා වූ නියමයන් වෙනස් කිරීමට මණ්ඩලය සතු බලය.

30. (1) යම් නඩත්තු නියමයන් යම් කරුණු වරදවා දැක්වීමක් මත හෝ සිද්ධිමය කරුණු පිළිබඳ වරදක් මත හෝ පදනම් වූ නියමයක් බවට මණ්ඩලය සෑහීමකට පත්වන අවස්ථාවක හෝ ඉල්ලුම්කරුගේ හෝ වගඋත්තරකරුවන්ගේ හෝ අවස්ථානුගත කරුණු සම්බන්ධයෙන් යම් වැදගත් වෙනසක් සිදු වී ඇති අවස්ථාවක හෝ වෙනත් තැනැත්තකු වගඋත්තරකරුවකු ලෙස එකතු කර ඇති අවස්ථාවක හෝ නඩත්තු ප්‍රදානය කිරීම සුරක්ෂිත කර තිබුණ ද නොතිබුණ ද මණ්ඩලය විසින් යම් පවත්නා නඩත්තු නියමයන් වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.



(2) නඩත්තු නියමයක් වෙනස් කිරීම සඳහා වූ ඉල්ලීමක්–

(අ) ඉල්ලුම්කරු විසින් ;

(ආ) වගඋත්තරකරුවකු විසින් ;

(ඇ) 25 (2) වගන්තියේ සඳහන් යම් අනුමත පුද්ගලයකු හෝ සංවිධානයක් විසින් ; හෝ

(ඈ) ලබාගත් නඩත්තු මුදල් සම්බන්ධයෙන් වන විට වගඋත්තරකරුගේ නෛතික පෞද්ගලික නියෝජිතයන්,

විසින් කරනු ලැබිය හැකි ය.

(3) වගඋත්තරකරුවන් එක් අයකුට වැඩි සංඛ්‍යාවකට එරෙහිව නඩත්තු නියමයක් කරනු ලැබූ අවස්ථාවක දී හෝ වෙනත් වගඋත්තරකරුවකු එකතු කරනු ලැබූ අවස්ථාවක දී නඩත්තු නියමය වෙනස් කිරීම සඳහා වූ ඉල්ලීමක් මත මණ්ඩලය විසින් අවස්ථානුකූලව සාධාරණ සහ යුක්ති සහගත යැයි මණ්ඩලය සලකන ආකාරයකට නඩත්තු මුදල නැවත බෙදා වෙන් කළ හැකි ය.

මණ්ඩලයේ නියමයන් යටතේ ගෙවනු ලබන නඩත්තු මුදල් අන්සතු කළ නොහැකි බව.

31. මේ පනත යටතේ යම් තැනැත්තකුට ගෙවනු ලබන නඩත්තු මුදල් පවරනු නොලැබිය හැකි ය. අන්සතු කළ නොහැකි ය. තවද එවැනි මුදලක් යම් ණයක් හෝ කවර ආකාරයක හෝ හිමිකම් පෑමක් සඳහා හෝ ඒ සම්බන්ධයෙන් හිලව් කිරීමට යටත් නොවිය යුතු අතර, තහනමකට භාජනය කරනු නොලැබිය යුතු ය.

නඩත්තු නියමයන් ක්‍රියාවේ යෙදවීම.

32. මේ පනත යටතේ කරන ලද නඩත්තු නියමයන් ක්‍රියාවේ යෙදවීමේ කාර්ය සඳහා නඩත්තු ආඥාපනත යටතේ මහේස්ත්‍රාත්වරයකු විසින් කරන ලද ආඥාවක් ලෙස සලකනු ලැබිය යුතු අතර, නඩත්තු නියමය කරනු ලැබුවේ යම් ඉල්ලුම්කරුවකුගේ වාසියට ද එකී ඉල්ලුම්කරු පදිංචිව සිටින ප්‍රදේශයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා විසින් නඩත්තු ආඥාපනත යටතේ කරන ලද නඩත්තු ආඥාවක් ක්‍රියාවේ යොදවන ආකාරයටම මෙම නියමය ක්‍රියාවේ යොදවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ හෝ එහි සාමාජිකයකුගේ අධිකාරයට එරෙහිව හෝ ඊට අපහාස වන පරිදි ක්‍රියා කිරීමේ වරද.

33. (1) (අ) යම් තැනැත්තකු විසින් ප්‍රමාණවත් හේතු නොමැතිව, මණ්ඩලය විසින් යම් පරීක්ෂණයක් පවත්වන අතරතුර දී හෝ එය අවසන් වීමෙන් පසු හෝ මණ්ඩලයට හෝ එහි යම් සාමාජිකයකුට අපහාස වන ආකාරයට යම් ප්‍රකාශයක් පළ කරන හෝ වෙනත් යම් ක්‍රියාවක් කරන අවස්ථාවක දී ;

(ආ) එම මණ්ඩලයේ නීත්‍යානුකූල ක්‍රියාවලියට යම් තැනැත්තකු බාධා කරන අවස්ථාවක දී ;

(ඇ) සිතාසියේ සඳහන් කරනු ලබන වේලාවේ දී සහ ස්ථානයේ දී මණ්ඩලයේ මතය අනුව සාධාරණ හේතුවක් නොමැතිව මණ්ඩලය ඉදිරියේ පෙනී සිටීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක දී ; හෝ

(ඈ) මණ්ඩලයේ මතය අනුව සාධාරණ හේතුවක් නොමැතිව, මණ්ඩලය විසින් කරගෙන යනු ලබන පරීක්ෂණයට අදාළව ඔහුගෙන් අසනු ලබන යම් ප්‍රශ්නයකට උත්තර දීම හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක දී,

එම තැනැත්තා මණ්ඩලයේ අධිකාරයට එරෙහිව හෝ මණ්ඩලයට අපහාස වන පරිදි අපහාසය පිළිබඳ වරදක් සිදු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයට එරෙහිව හෝ එහි අධිකාරයට අපහාස වන පරිදි සිදු කරන ලද සෑම අපහාසය පිළිබඳ වරදක්ම අභියාචනාධිකරණයට අපහාස වන පරිදි සිදු කරන ලද වරදක් ලෙස සලකා අභියාචනාධිකරණය විසින් දඬුවම් කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයට එරෙහිව හෝ එහි අධිකාරයට අපහාස වන පරිදි සිදු කරන ලද අපහාසයක් පිළිබඳ සෑම පැමිණිල්ලක් ම මණ්ඩලයේ සභාපතිවරයා විසින් ස්වකීය අත්සන් සහිත ලියවිල්ලක් මගින් අභියාචනාධිකරණයේ සභාපතිවරයා වෙත දන්වනු ලැබිය යුතු ය.

(4) අභියාචනාධිකරණය විසින් (3) වන උපවගන්තිය යටතේ අභියාචනාධිකරණයේ සභාපතිවරයාට ලියවිල්ලක් ලැබීමෙන් පසු එකී ලියවිල්ලෙහි සඳහන් අපහාස වරද සිදු කරනු ලැබූ බවට, නම්කර ඇති තැනැත්තා වෙත අධිකරණයට අපහාස කිරීම පිළිබඳව නයිසයි ආඥාවක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) (4) උපවගන්තිය යටතේ තමා වෙත නයිසයි ආඥාවක් නිකුත් කරනු ලැබූ තැනැත්තකු අධිකරණය සෑහීමට පත්වන පරිදි නිදහසට කරුණු දක්වන්නේ නම් මිස, ඔහු දඬුවම් ලැබීමට යටත් විය යුතු ය.



(6) මණ්ඩලයට එරෙහිව හෝ එහි අධිකාරයට අපහාස වන පරිදි හෝ මණ්ඩලයේ සාමාජිකයකුට එරෙහිව සිදු කරන ලද අපහාස වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට එරෙහිව පවතින නඩු කටයුත්තක දී මණ්ඩලයේ කිසිම සාමාජිකයෙක් එකී තැනැත්තා විසින් සාක්ෂි සඳහා කැඳවීමට යටත් නොවිය නමුත් අභියාචනාධිකරණය විසින් ඔහු කැඳවීම අවශ්‍ය යයි සලකන්නේ නම් එම සාමාජිකයා කැඳවා සාක්ෂි විභාග කළ හැකි ය.

## VII වන කොටස

### පොදු විධිවිධාන

**34.** (1) නියම් කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනත යටතේ බලය දී ඇති හෝ අවශ්‍ය විය හැකි සියලු කාරණා සඳහා හෝ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එය පළ කරනු ලැබීමේ දින සිට හෝ ඒ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එකී අනනුමතයේ දින සිට, එහෙත් එකී නියෝගය යටතේ කලින් කරන ලද දෙයකට ඉන් හානියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය.

**35.** (1) සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද, කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා ද, බලපාන හෝ ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වන යම් කරුණකට අදාළව අවශ්‍ය යයි සභාව විසින් සලකනු ලබන රීති සභාව විසින් සාදනු ලැබිය හැකි ය. රීති සෑදීම සඳහා සභාවට ඇති බලය.

(2) සභාව විසින් සාදනු ලබන සෑම රීතියක් ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත කිරීම පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය.

පරීක්ෂා කිරීමට හා සෝදිසි කිරීමට සභාවට ඇති බලතල.

**36.** සභාව විසින් බලය පවරන ලද යම් නිලධරයකු

(අ) වැඩිහිටි තැනැත්තන්ට සේවා සහ ආධාර සැලසීමේ යෙදී සිටින යම් ස්වේච්ඡා සංවිධානයක පරිශ්‍රයට ඇතුළු වී එය පරික්ෂා කළ හැකි ය;

(ආ) මේ පනත යටතේ ලියාපදිංචි නොවී යම් ස්වේච්ඡා සංවිධානයක් වැඩිහිටි තැනැත්තන්ට සේවා සහ ආධාර සැලසීමේ යෙදී සිටින බවට ඔහුට විශ්වාස කිරීමට හේතු ඇති අවස්ථාවක දී එම පරිශ්‍රයට ඇතුළු වී එය පරික්ෂා කිරීම කළ හැකි ය ;

(ඇ) එවැනි සංවිධානයක් විසින් පවත්වා ගෙන යනු ලබන පොත්පත්, ලේඛන හෝ වාර්තා පරීක්ෂා කොට එහි උධෘත හෝ පිටපත් ලබා ගැනීම කළ හැකි ය ;

(ඈ) මේ පනතේ විධිවිධානවලට එකඟව ක්‍රියා කර ඇද්ද යන්න දැන ගැනීමේ කාර්ය සඳහා එවැනි යම් පරිශ්‍රයක සිටින යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීම කළ හැකි ය.

ලේඛ්‍රප් පනතේ අර්ථානුකූලව සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**37.** සභාව, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

මේ පනත යටතේ හෝ සභාවේ විධාන මත කරන ලද ක්‍රියාවක් සම්බන්ධයෙන් සභාවේ සාමාජිකයන් හා නිලධරයන් ආරක්ෂා කිරීම.

**38.** (1) මේ පනත යටතේ හෝ සභාවේ විධාන මත සභාවේ සාමාජිකයකු විසින් හෝ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් සඳහා ඔහුට විරුද්ධව කිසිම අපරාධ හෝ සිවිල් නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරිපිට සභාව විසින් හෝ සභාවට විරුද්ධව, පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, සභාව විසින් දැරූ යම් වියදමක් සභාවේ අරමුදලින් ගෙවිය යුතු අතර, එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී සභාව වෙත ගෙවන ලද හෝ සභාව විසින් අයකරගන්නා ලද යම් නඩු ගාස්තුවක් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ සභාවේ විධානයක් මත (1) උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී එම ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබ ඇතැයි අධිකරණය තීරණය කරන්නේ නම්, එම තැනැත්තා විසින් ඒ නඩුවේ දී දරන ලද යම් වියදමක් එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී එම තැනැත්තා විසින් අයකර ගනු ලැබුවේ නම් මිස, එම වියදම සභාව විසින් ඔහුට ගෙවනු ලැබිය යුතු ය.



සාමාජිකයකුට හෝ දේපළකට එරෙහිව කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**39.** සභාවට එරෙහිව පවරන ලද යම් නඩුවක දී සභාවේ සාමාජිකයකුට එරෙහිව, පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට එරෙහිව කිසිම රිට් ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

වාර වාර්තා.

**40.** මේ පනත යටතේ ස්වකීය කර්තව්‍යය ඉටු කිරීමේ කාර්ය සඳහා සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි කරුණු සම්බන්ධයෙන්, සභාව විසින් නිශ්චය කරනු ලබන ආකෘති පත්‍ර වලට අනුව, වාර්තා හා තොරතුරු සභාව වෙත ඉදිරිපත් කරන ලෙස, යම් තැනැත්තකු වෙත සභාව විසින් නියම කරනු ලැබිය හැකි ය.

වැරදි.

**41.** යම් තැනැත්තකු–

(අ) මේ පනත යටතේ ඔහු වෙත පනවා ඇති යම් නියමයකට අනුකූලව යම් වාර්තාවක් හෝ තොරතුරක් සැපයීමට අපොහොසත් වුවහොත් ;

(ආ) ඔහු විසින් සපයනු ලබන යම් වාර්තාවක හෝ තොරතුරක, දැන දැනම යම් අසත්‍ය ප්‍රකාශයක් කරනු ලැබුවහොත් ;

(ඇ) ඔහු විසින් සපයනු ලබන යම් වාර්තාවක හෝ තොරතුරක සිතාමතා යම් කරුණක් අත්හරිනු ලැබුවහොත් ;

(ඈ) මේ පනතේ 36 වගන්තිය මගින් හෝ ඒ යටතේ බලයලත් නිලධරයකුට පවරන ලද බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමේ දී ඒ නිලධරයාට බාධා කරනු හෝ ප්‍රතිරෝධය පානු ලැබුවහොත් ;

(ඉ) මණ්ඩලය විසින් කරන ලද නඩත්තු නියමයකට හෝ මණ්ඩලය විසින් දෙන ලද යම් විධානයකට එකඟව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත් ;

(ඊ) මේ පනතේ විධිවිධාන හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් කඩ කරනු ලැබුවහොත්,

ඒ තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයෙක් ඉදිරිපිට දී පවත්වන ලද ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්ලක්ෂයකට නොවැඩි දඩයක් හෝ අවුරුදු එකක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වැරදි.

**42.** පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ යම් වරදක් සිදු කරන ලද අවස්ථාවක දී –

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වන අවස්ථාවක දී එම සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයෙක්ම, ලේකම්වරයෙක් හා නිලධරයෙක්ම එම වරදට, වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් වන අවස්ථාවක දී එම ව්‍යාපාර ආයතනයේ සෑම හවුල් කරුවකුම එම වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුවද, එම වරද සිදු කරන ලද්දේ ඔහුගේ දැනීමෙන් තොරව බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම පිණිස ඔහු විසින් නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඔප්පු කළහොත්, මේ පනත යටතේ වරදකට ඒ තැනැත්තා වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**43.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**44.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි –

"ළමයා" යන්නට අවජාතක හෝ දරුකමට හදා ගන්නා ලද ළමයකු සහ සුළු දරුවකු ද ඇතුළත් වේ.

"වැඩිහිටි තැනැත්තා" යන්නෙන්, වයස අවුරුදු හැට ඉක්ම වූ යම් තැනැත්තෙක් අදහස් වේ.

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක්, ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක



කරනු ලබන, කරනු ලබන සහ ඉටු කරනු ලබන බලතල, කාර්ය හා කර්තව්‍යවලට අනුරූප වන හෝ සමානවන බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ ඇති කරන ලද්දා වූ සහ පිහිටුවන ලද්දා වූ යම් අධිකාරියක් ද ඊට ඇතුළත් වේ.

"නියමිත" යන්නෙන් ,මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කර ඇති බව අදහස් වේ.

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ.

උපලේඛනය [24 (2) වන වගන්තිය]

1. මණ්ඩලය සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුතු අතර ඉන් එක් තැනැත්තකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කළ යුතු ය.

2. මණ්ඩලයේ සෑම සාමාජිකයකුම කලින් ධුරය අතහැරියහොත් මිස, අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු ය.

3. මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා මණ්ඩලයට හැකිවීම පිණිස අවශ්‍ය විය හැකි ලේකම්වරයකු සහ (සමථ නිලධරයන් ද ඇතුළුව) වෙනත් නිලධරයන් හා සේවකයන් මණ්ඩලයට පත් කරනු ලැබිය යුතු ය.

4. මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක්ම මණ්ඩලයේ රැස්වීමක දී සලකා බලනු ලැබ තීරණය කරනු ලැබිය යුතු ය.

5. මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය තුන්දෙනකු විය යුතු ය.

6. (1) වන ඡේදය යටතේ පත් කරන ලද මණ්ඩලයේ සභාපතිවරයා මණ්ඩලයේ රැස්වීමකට පැමිණ සිටියහොත්, එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ සභාපතිවරයා මණ්ඩලයේ යම් රැස්වීමකට පැමිණ නොසිටියහොත් පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරින් යම් තැනැත්තකු එම රැස්වීම සඳහා සභාපතිවරයා ලෙස තෝරා පත් කරනු ලැබිය යුතු ය.

7. (අ) මණ්ඩලයේ යම් රැස්වීමක දී සලකා බලනු ලැබූ යම් ඉල්ලීමක් මත කරන ලද තීරණයක් එම ඉල්ලීම මත මණ්ඩලය විසින් කරන ලද තීරණයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) යම් ඉල්ලීමක් මත මණ්ඩලයේ තීරණය පිළිබඳව මණ්ඩලයේ සාමාජිකයන් එකඟ නොවන අවස්ථාවක දී එම සාමාජිකයන් වැඩිදෙනකුගේ තීරණය එම ඉල්ලීම පිළිබඳව මණ්ඩලයේ තීරණය විය යුතු අතර මණ්ඩලයේ සාමාජිකයන් යම් තීරණයක් පිළිබඳව සමානව බෙදී ඇති අවස්ථාවක දී රැස්වීමේ සභාපතිවරයා විසින් සහය දක්වනු ලබන තීරණය එම ඉල්ලීම පිළිබඳව මණ්ඩලයේ තීරණය ලෙස සලකනු ලැබිය යුතු ය.

8. මණ්ඩලයේ සභාපතිවරයාට හෝ මණ්ඩලයේ එම රැස්වීමේ දී සභාපතිවරයා මුලසුන දරනු නොලබන්නේ නම් එම රැස්වීමේ සභාපතිවරයාට හෝ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම නිරණය කිරීමේ කාර්ය සඳහා -

(අ) සාක්ෂිකරුවන් කැඳවීම සහ ඔවුන්ගේ පැමිණීම අනිවාර්ය කිරීම ;

(ආ) ලේඛන ඉදිරිපත් කරන ලෙස බල කිරීම;

(ඇ) සාක්ෂිකරුවන්ට යම් දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් ලබාදීම ;

(ඈ) සමථයකට පත්කිරීමේ කාර්ය සඳහා සමථ නිලධරයා ඉදිරියට යම් තැනැත්තකු කැඳවීම ;

(ඉ) ඉල්ලීමක ප්‍රතිඵලයක් වශයෙන් පවත්වන ලද යම් පරීක්ෂණයකට මහජනතාව පැමිණීම වැළැක්වීම,

යන කරුණු සඳහා දිසා අධිකරණයට ඇති සියලු බලතල තිබිය යුතු ය.

9. (අ) මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක්, එකී ඉල්ලීම විභාග කිරීමට පෙර, මණ්ඩලය විසින් එය සමථයට පත් කිරීම සඳහා සමථ නිලධරයකු වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(ආ) පාර්ශ්වයන් අතර ඇති මතභේද විසඳීමට උත්සාහ කිරීම සහ ඔවුන් අතර සමථයක් ඇති කිරීමට උදව් කිරීම (අ) ඡේදය යටතේ තමන් වෙත යම් කරුණක් යොමු කරනු ලැබූ, සමථ නිලධරයකුගේ කාර්යය විය යුතු ය.

(ඇ) පාර්ශ්වයන් අතර සමථයක් ඇති වූ අවස්ථාවක දී, මණ්ඩලය විසින්, 27 වන වගන්තිය යටතේ කරනු ලබන නියමයක් මගින් එම සමථය බලාත්මක කරනු ලැබිය යුතු ය.

10. මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් හෝ මණ්ඩලයට යම් සාමාජිකයකු පත් කිරීමේ දී යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත ලෙස සලකනු නොලැබිය යුතු ය.

11. මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික මණ්ඩලයේ සාමාජිකයන් වෙත ගෙවනු ලැබිය යුතු ය.

12. (අ) සෑම සිතාසියක්ම මණ්ඩලයේ සභාපතිවරයාගේ අත්සන යටතේ ඉදිරිපත් කළ යුතු ය.

(ආ) යම් සිතාසියක් එම සිතාසියේ නම් කර ඇති තැනැත්තා වෙත භාරදීමෙන් හෝ එසේ ප්‍රායෝගිකව භාර දිය නොහැකි අවස්ථාවල දී එම තැනැත්තා අවසන්වරට පදිංචිව සිටි ස්ථානයෙහි තැබීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන් එම සිතාසිය භාර දෙනු ලැබිය හැකි ය.

(ඇ) සිතාසි භාර දෙනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද එවැනි සෑම තැනැත්තකුම එම සිතාසියේ සඳහන් වේලාවේ දී සහ ස්ථානයේ දී මණ්ඩලය වෙත පැමිණිය යුතු අතර මණ්ඩලය විසින් ඔහුගෙන්



අසන ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය; තවද සිතාසියේ සඳහන් ඉල්ලීමට අනුව ඔහුට නියම කර ඇති සහ ඔහු සන්තකයේ හෝ බලය යටතේ ඇති ලේඛන හෝ වෙනත් දේ ඉදිරිපත් කිරීම ද ඔහු විසින් කළ යුතු ය.

(ඈ) (අ) අනුඡේදයට අනුකූලව යම් තැනැත්තකු වෙත ලියාපදිංචි තැපෑලෙන් යවන ලද යම් සිතාසියක් එය අමතන ලද තැනැත්තා වෙත, එය සාමාන්‍ය තැපෑලේ දී භාර දෙනු ලබන අවස්ථාවේ දී, යථා පරිදි භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, සිතාසිය භාරදුන් බව ඔප්පු කිරීමේ දී ඒ සිතාසිය ඇතුළත් ලියුම් කවරය නිසි පරිදි ලිපිනය ලියා මුද්දර අලවා ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබූ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් වේ.

13. (1) මණ්ඩලය ඉදිරියේ සාක්ෂි දෙන යම් තැනැත්තකුට එම සාක්ෂි සම්බන්ධයෙන් අධිකරණයක් ඉදිරිපිට සාක්ෂි දෙන තැනැත්තකුට හිමි සියලු වරප්‍රසාදවලට හිමිකම් තිබිය යුතු ය.

(2) මණ්ඩලය වෙත හෝ එය ඉදිරිපිට දෙන ලද ලිඛිත හෝ වාචික සාක්ෂි සම්බන්ධයෙන් එම තැනැත්තාට එරෙහිව කිසිම අධිකරණයක දී සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පවරනු ලැබීමට මඟ යටත් නොවිය යුතු ය.

(3) මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති ආකාරයට යටත්ව මණ්ඩලය වෙත හෝ එය ඉදිරිපිට යම් තැනැත්තකු විසින් දෙන ලද හෝ කරන ලද යම් ප්‍රකාශයක් පිළිබඳ සාක්ෂියක් යම් අධිකරණයක සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී එම තැනැත්තාට එරෙහිව ආවේශය කරනු නොලැබිය යුතු ය.

එසේ වුවද, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධානවල ඇතුළත් කිසිවක් -

(අ) 14 වන ඡේදය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ XI වන පරිච්ඡේදය යටතේ යම් වරදක් සඳහා යම් නඩු පැවරීමක් හෝ දණ්ඩනයක් කෙරෙහි බල නොපෑ යුතු ය; නැතහොත් බලපාන්නේ යයි සලකනු නොලැබිය යුතු ය; නැතහොත් බලපාන්නේ යයි තේරුම් ගනු නොලැබිය යුතු ය ;

(ආ) දණ්ඩ නීති සංග්‍රහයේ XI වන පරිච්ඡේදය යටතේ යම් සාක්ෂිකරුවකුට එරෙහිව නඩු පැවරීමේ කාර්ය සඳහා, මණ්ඩලය ඉදිරියේ දී සාක්ෂි දෙන ඒ සාක්ෂිකරුගේ නම හෝ ඒ සාක්ෂිකරු විසින් දෙන ලද සාක්ෂිය හෝ එහි යම් කොටසක් හෝ පළ කිරීම හෝ හෙළි කිරීම තහනම් නොකළ යුතු ය; නැතහොත් තහනම් වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය; නැතහොත් තහනම් වන්නේ යයි තේරුම් ගනු නොලැබිය යුතු ය.

14. (අ) මණ්ඩලයේ සාමාජිකයන් සහ මණ්ඩලයට සහායවීම සඳහා පත් කරන ලද ලේකම්වරයා සහ නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් ප්‍රකාර මණ්ඩලය විසින් පවත්වනු ලබන සෑම පරීක්ෂණයක්ම දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව අධිකරණමය නඩු කටයුත්තක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) මණ්ඩලය වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ පාර්ශ්වයක් එම ඉල්ලීම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයකින් අතෘප්තියට පත්වන අවස්ථාවක දී එම පාර්ශ්වය විසින් අනෙක් පාර්ශ්වය වග උත්තරකරුවකු ලෙස සඳහන් කරමින් එම තීරණයට එරෙහිව නීතිය පිළිබඳ ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණය වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(ඇ) එවැනි සෑම අභියාචන පෙත්සමක්ම එම අභියාචනය අදාළ වන තීරණයේ දින සිට දින විසිඑකක කාලයක් ඇතුළත අභියාචනාධිකරණය වෙත ගොනු කරනු ලැබිය යුතු ය.

(ඈ) මහෙස්ත්‍රාත් අධිකරණවලින් අභියාචනාධිකරණය වෙත අභියාචන ඉදිරිපත් කිරීමට අදාළ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXVIII පරිච්ඡේදයේ විධිවිධාන මේ ඡේදය යටතේ අභියාචන විභාග කිරීම සහ අසා නිම කිරීමට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.